**රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ: 16/2000**

මගේ අංකය: ආ/III/2/1-6
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා
පරිපාලන ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
2000 නොවැම්බර් මස වැනි දින.

අමාත්‍යාංශ ලේකම්වරු,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරු,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා
රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්.

**<u>2000 රමලාන් (රමසාන්) සමයේදී විශේෂ නිවාඩු ලබාදීම.</u>**

මෙවර රමලාන් (රමසාන්) සමය 2000 නොවැම්බර් මස 27 දින ආරම්භ වී 2000 දෙසැම්බර් 28 දින අවසන් වීමට නියමිත බැවින් එම කාල සීමාව තුළදී මුස්ලිම් නිලධාරීන්ට/සේවකයින්ට යාඥා සහ ආගමික වතාවත්වල නිරතවිය හැකිවන පරිදි වැඩ පිළිවෙලක් සකස් කරන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.

02. යාඥා හා ආගමික කටයුතු දිනපතා සිදු කෙරෙන කාල වේලාවන් පහත දැක්වෙන පරිදි වේ.

- පෙරවරු 3.30 සිට පෙරවරු 6.00 දක්වා
- පෙරවරු 6.30 සිට පෙරවරු 7.30 දක්වා
- පස්වරු 6.30 සිට පස්වරු 7.30 දක්වා
- පස්වරු 8.30 සිට පස්වරු 10.30 දක්වා

03. හැකි සෑම අවස්ථාවකදීම එම නිලධාරීන්ට/සේවකයන්ට ආගමික වතාවත්වල යෙදීමට හැකිවන පරිදි වැඩමුර සකස්කර දිය යුතුය. නොවැළැක්විය හැකි අවස්ථාවන්වලදී පමණක් විශේෂ නිවාඩු අනුමත කිරීම මැනවි.

04. රමලාන් (රමසාන්) අවසන්වීමට දින 14 කට කලින් රාජ්‍ය සේවයේ, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල සුදුසුකම් ඇති මුස්ලිම් නිලධාරීන්ට/සේවකයින්ට උත්සව අත්තිකාරම් මුදල් ලබාදීමට ද කරුණාකර කටයුතු කරන්න.

එම්.එන්.ජුනයිඩ්
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා
පරිපාලන ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය.